අද 2016 03.16

# 2015 වසරේ දළ දේශීය නිෂ්පාදිතය රු.මිලියන 8,622,825 දක්වා ඉහළට

## - 2015 ආර්ථික වර්ධන වේගය 4.8% යි
## - කෘෂි 5.5%, කර්මාන්ත 3.0% හා සේවා 5.3% ක වර්ධන වේගයක්




**ෂමිල පෙරේරා**

2015 වසරේ ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධන වේගය 4.8% ක් බවත්, ඒ අනුව, සමස්තයක් ලෙස 2015 වර්ෂය සඳහා දළ දේශීය නිෂ්පාදිතය ස්ථාවර මිල ගණන් යටතේ රු.මිලියන 8,622,825 දක්වා ඉහළ ගොස් ඇති බවත් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව පවසයි.

එම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය ඒ.ජේ. සතරසිංහ මහතාගේ ප්‍රධානත්වයෙන් ඊයේ (15දා) රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේදී පැවැති මාධ්‍ය හමුවකදී ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තුමේන්තුව මගින් 2015 සිවුවැනි කාර්තුවට සහ 2015 වර්ෂයට අදාළව ගණනය කරන ලද ජාතික ගිණුම් ඇස්තමේන්තු ප්‍රකාශයට පත්කරමින් මෙම තොරතුරු අනාවරණය විය.

එහිදී, සමස්තයක් ලෙස 2015 වර්ෂය සඳහා ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතය ස්ථාවර මිල ගණන් යටතේ රු.මිලියන 8,622,825 දක්වා ඉහළ ගොස් ඇති අතර, මෙය 2014 වර්ෂයේදී වාර්තා ගතවූ දළ දේශීය නිෂ්පාදිතය වන රු.මිලියන 8,228,986 ට සාපේක්ෂව 4.8% ක වර්ධනයක් බව සඳහන් විය. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තුමේන්තුව විසින් දළ දේශීය නිෂ්පාදිතය ඇස්තමේන්තු කිරීම අදියර කිහිපයක් යටතේ සිදුකරන අතර, මෙම එක් එක් අදියරේදී ගණනය කරන ඇස්තමේන්තු ඒ වනවිට ලැබී ඇති දත්ත මත රඳා පවතින බවද එම දෙපාර්තමේන්තුව පවසයි.

තවද, මෙම ඇස්තමේන්තු යාවකාලීක, සංශෝධිත හා අවසාන ඇස්තමේන්තු ලෙස ප්‍රකාශයට පත් කරන අතර අවසාන ඇස්තමේන්තු තවදුරටත් සංශෝධනය නොවන බවද පෙන්වා දෙයි. ඒ අනුව, 2014 වර්ෂය සඳහා ප්‍රකාශිත ආර්ථික වර්ධන වේගය 4.5 සිට 4.9 දක්වා සංශෝධනය වී ඇති අතර, 2015 වර්ෂය සඳහා ශ්‍රී ලංකාවේ මුළු දළ දේශීය නිෂ්පාදිත පවත්නා මිල ගණන් යටතේ රු.මිලියන 11,183,220 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

2015 වර්ෂය සඳහා ආර්ථිකයේ ප්‍රධානම සංරචකයන් වන කෘෂිකාර්මික, කර්මාන්ත, සේවා සහ භාණ්ඩ මත අය කෙරෙන ශුද්ධ බදු පිළිවෙළින් 7.9%, 26.2%, 56.6% සහ 9.3% ක් වශයෙන් ස්ථාවර මිල ගණන් (2010) යටතේ දළ දේශීය නිෂ්පාදිතයට දායක වී ඇත. තවද, 2015 වර්ෂය තුළදී මින් ප්‍රධාන ආර්ථික කටයුතු වන කෘෂිකර්මික, කර්මාන්ත හා සේවා ක්‍රියාකාරකම් 2014 වර්ෂයට සාපේක්ෂව පිළිවෙළින් 5.5%ක් 3.0%ක් සහ 5.3% ක් වශයෙන් ඉහළ වර්ධන වේගයන් වාර්තා කර ඇත.

2015 වර්ෂය තුළදී කෘෂිකාර්මික උප ක්‍රියාකාරකම් වන 'වී වගා කිරීම' සහ 'එළවළු වගා කිරීම' සඳහා 2014 වර්ෂයට සාපේක්ෂව පිළිවෙළින් 23.3% ක් සහ 24.9% ක් වශයෙන් ඉහළ වර්ධන වේගයක් ඇති අතර 'සත්ත්ව නිෂ්පාදනය' සහ පොල් වගාව ඇතුළත් 'තෙල් සහිත පලතුරු භෝග වගාව' පිළිවෙළින් 8.0% ක් සහ 5.1% ක් ලෙසද වර්ධනය වී ඇත. 'තේ වගා කිරීම' සහ 'කරදිය මත්ස්‍ය කර්මාන්තය' යන කෘෂිකාර්මික ආර්ථික ක්‍රියාකරකම් පිළිවෙළින් -2.6% ක් සහ -1.5% ක් වශයෙන් සුළු පසුබෑමකට ලක් වී ඇත.

එසේම, 2015 වර්ෂය තුළදී කර්මාන්ත උප ආර්ථික ක්‍රියාකරකම් අතුරින් 'ආහාර ද්‍රව්‍ය, බීම වර්ග සහ දුම්කොළ නිෂ්පාදනය', 'රබර් සහ ප්ලාස්ටි'ක් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත', 'ගෘහභාණ්ඩ නිෂ්පාදන කර්මාන්තය' සහ 'විදුලිය නිෂ්පාදන කර්මාන්ත 'පිළිවෙළින් 5.6%, 4.7 %, 6.7 % සහ 7.8 % කැපී පෙනෙන වර්ධනයක් ලබාගෙන ඇත. එසේම 'පතල් හා කැණීම් කර්මාන්තය' සහ ඉදිකිරීම් කර්මාන්තය යන කර්මාන්ත උප ක්‍රියාකාරකම් දෙකම -0.9% බැගින් වන සුළු පහත වැටීමක් පෙන්නුම් කරයි.

2015 වර්ෂය තුළදී සේවා අංශයේ උප ක්‍රියාකරකම් වන 'පරිගණක සේවා වැඩසටහන් උපදේශනය සහ තොරතුරු සේවා ක්‍රියාකරකම්', 'මූල්‍ය සේවා කටයුතු' සහ 'දේපොළ වෙළෙඳම් කටයුතු' යන උප ක්‍රියාකරකම් සඳහා පිළිවෙළින් 21.1% ක්, 15.8 % ක් සහ 9.6 % ක් ලෙස වාර්තා වූ, කැපී පෙනෙන වර්ධන වේගයන් සේවා අංශයෙහි වර්ධනයට දායක වී ඇත.

මාධ්‍ය සාකච්ඡාවේදී අනාවරණය කළ පරිදි 2015 වර්ෂයේ සිවුවැනි කාර්තුව සඳහා ස්ථාවර මිල ගණන් (2010) යටතේ නිෂ්පාදන ප්‍රවේශයට අනුකූලව ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතය රු.මිලියන 2,387,136 ක් වන අතර, සිවුවැනි කාර්තුවේ වර්ධන වේගය 2014 වර්ෂයේ සිවුවැනි කාර්තුවට සාපේක්ෂව 2.5% ක් ලෙස වාර්තා වේ. 2015 වර්ෂයේ පළමු වැනි, දෙවැනි සහ තෙවැනි කාර්තු සඳහා ආර්ථික වර්ධන වේගයන් පිළිවෙළින් 4.4% ක්, 7.0% ක් සහ 5.6% ක් ලෙස සංශෝධනය වී ඇත.

2015 සිවුවැනි කාර්තුව තුළදී කෘෂිකර්මාන්තය 0.5% ක සුළු පසුබෑමක් වාර්තා කරන අතර, කර්මාන්ත සහ සේවා යන ප්‍රධාන ආර්ථික ක්‍රියාකාරකම් පිළිවෙළින් 1.9% ක් සහ 2.7% ක් ලෙස වර්ධන වේගයන් වාර්තා කර ඇත.

DEPARTMENT OF CENSUS & STATISTICS
LIBRARY
COLOMBO